යම් කිසි ජන සමාජයක භාවිතා කරනා භාෂාවට එම ජනසමාජයේ ශිෂ්ටත්වය හැඩගැස්වීමේ හැකියාවක් ඇති බව කියැවේ. ඇතැම් විටකදී අප භාවිතා කරනා භාෂාවේ වන යම් යම් යෙදුම් ඔස්සේ සිදුකරනා කොන්කිරීම් සහ ගර්හාවන් වළක්වාලීම සඳහා සුදුසු වෙනත් යෝග්‍ය යෙදුම් භාවිතා කිරීමට යොමු විය යුත්තේ ඒ හෙයිනි.

මෙවැනි නිෂේධනාත්මක යෙදුම් සඳහා උදාහරණ ලෙසින් "කුඩ්ඩෝ",, "මතට ලොල් වූ" වැනි යෙදුම් දැක්විය හැක. කුඩ්ඩා වැනි යෙදුමක් හා බැඳී ඇති සමාජ ගර්හාව නිසා මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහි වූ අයෙකුට පුනරුත්ථාපනයෙන් පසුව හෝ සමාජය හා මුහු වීම අසීරු විය හැක. එසේම ඒ ඔස්සේ පොදුවේ අයෙකුගේ පුද්ගල ගෞරවයද නැති කරයි. එසේම මත්ද්‍රව්‍ය සඳහා වන ඇබ්බැහියක් යනු සරලවම මත්ද්‍රව්‍ය සඳහා ලොල් වීමකට වඩා සංකීර්ණ කාරණා සමගින් සිදුවන්නක් බැවින්, මත්ද්‍රව්‍ය ඇබ්බැහියක් හුදු ලෝලත්වයක ලඝු කිරීම අයෝග්‍ය නොවේදැයි විමසිය යුතු වේ.

පහත දැක්වෙන පුවත් වාර්තාවන්හි සිරස්තලයන් තුළ මෙම නිෂේධනාත්මක යෙදුම් දක්නට ලැබුණද, පුවත් අන්තර්ගතයන් තුළ වඩාත් නිවැරදි අයුරින් "හෙරොයින් පානය කිරීමට ඇබ්බැහි වී සිටි"/ "මත්කුඩුවලට ඇබ්බැහි වී සිටින" [පුද්ගලයින්] ආදී වශයෙන් දැක්වේ. සිරස්තලයකදී අවම වචන ප්‍රමාණයකින් අදහසක් දැක්වීම අවශ්‍ය වුවත්, එහිදී නිෂේධනාත්මක යෙදුම් මගහරවා ගැනීම, මාධ්‍ය අත රැඳි වගකීමක් බවද මෙසේම දක්වමු.

#MediaEthicsSL #lka #SinhalaPress #Divaina #Lankadeepa